මන්නාරම ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය.

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 ජනවාරි 27 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මන්නාරම ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

මූල්‍ය ප්‍රකාශ වල නිරීක්ෂණය වූ ගිනුම්කරණ අඩුපාඩු පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | 03 | 1,812,203 | - | - | - | - | 01 | 2,413,962 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 598,490 | 02 | 12,384,430 | 01 | 98,113 | - | - |
| | | | | | | | | - |

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

එකතුව රු.7,546,715 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා අවශ්‍ය වූ තොරතුරු විගණනයට ලබා නොදීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.3 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති 1988, පරිච්ඡේදය IX, - රීති 180 ප්‍රකාරව මුදල් හා ගබඩා භාරව සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති 1988, පරිච්ඡේදය III, රීති 59 ප්‍රකාරව වෙළඳ බලපත්‍ර ලබා ගැනීම පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති 1988, පරිච්ඡේදයIII, රීති 65 ප්‍රකාරව වෙළඳ බලපත්‍ර ලබාගැනීම පැහැර හැරි පුද්ගලයන්ගේ ලැයිස්තුවක් පිළියෙල කර සභාලේකම් වෙත භාර දී නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති 1988, පරිච්ඡේදය III ,රීති 81 ප්‍රකාරව සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසානයේදි මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ලබා ගැනිම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති 1988 පරිච්ඡේදය VII රීති 166 ප්‍රකාර පොදු ලෙජරයේ සටහන් තැබිම සඳහා ජ'නලයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඊ) රාජ්‍ය මුදල් රෙගුලාසි 700(5) ප්‍රකාරව ටෙන්ඩර් මණ්ඩල තීරණ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මා වූ පුනරාවර්ථන වියදම රු. 20,832,084 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.26,724,730 ක් විය.

2.2 මූල්‍ය කළමනාකරණය
-----------------------------

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය යථාර්ථ පදනමක් මත පිළියෙල කර නොමැති බව නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම, තථ්‍ය ආදායම සහ 2012.12.31 දිනට හිඟ හිටි ආදායම පහත ප්‍රකාශයේ දැක්වේ.

| ආදායම් විෂයය | අයවැයගත ආදායම | තථ්‍ය ආදායම | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 96,253 | 297,285 | 72,301 |
| බදු කුලි | 3,074,648 | 3,272,882 | 918,833 |
| බලපත්‍ර ගාස්තු | 520,543 | 359,052 | - |
| වෙනත් ආදායම් | 17,859,312 | 26,388,731 | 11,710,350 |

2.3.2 මුද්දර ගාස්තු

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.17,765,314 ක් වූ මුද්දර ගාස්තු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3.3 වෙනත් ආදායම්

(අ) 2009 වර්ෂයේ හිඟ හිටි රු.72,301 ක් වූ තක්සේරු බදු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවුරුදු 02 කට අධිකා කාලයක් තිස්සේ හිඟ හිටි රු.918,833 ක් වූ බදු කුලී අයකර ගැනිමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.4 කාර්ය සාධනය
-------------------

ප්‍රාග්ධන ව්‍යාපෘති 22 ක් සඳහා රු.91,774,000 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය මගින් සලසා තිබූ නමුත් ඉන් ව්‍යාපෘති 08 ක් පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් පරිදි විය.

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය | වියදම | කාර්ය සාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | (මිලියන) රු. | (මිලියන) රු. | % |
| 1. | එරුකලම්පිටි අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය | 7.177 | 3.18 | 50 |
| 2. | පේසාලෙයි අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය | 7.177 | 4.2 | 50 |
| 3. | පෙරියකරිසල් අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය | 7.177 | 5.64 | 50 |
| 4. | තාවුල්පාඩු ගවමස් කඩය ඉදිකිරිම | 4.717 | 1.2 | 50 |
| 5. | උයිලංකුලම් ගව ගාතකාගාරය ප්‍රතිසංස්කරණය කිරිම | 3.427 | 1.2 | 50 |
| 6. | උයිලංකුලම් ක්‍රීඩාපිටිය ඉදිකිරිම | 4.0 | 1.6 | 50 |
| 7. | එරුක්කලම්පිඩ්ඩි සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරිම | 5.202 | 0.8 | 50 |
| 8. | පුදුකුඩිඉරුප්පු අභ්‍යන්තර මාර්ග ඉදිකිරිම | 5.501 | 1.0 | 50 |

2.3.5 අභ්‍යන්තර විගණනය
----------------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) පරිත්‍යාග

(ඊ) වාහන උපයෝජනය

(උ) මිශ්‍ර තැන්පතු

(ඌ) අයවැය